# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 31 දරන නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 මැයි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 7.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2009 අංක 31 දරන නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 මැයි මස 18 වන දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 27/2004.

**නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 31 දරන නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයේ සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු " බහු කාර්ය ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු " සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. නිදහස් ළදරු අධ්‍යාපන බහුකාර්ය ආයතනය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ස්වයං රැකියා ව්‍යාපෘතිවල නිරතවීමට සාමාජිකයන් දිරිගැන්වීම, ඔවුනට ආධාර දීම සහ උපදෙස් දීම ;

(ආ) අමතර අධ්‍යාපන උපාංග හා පුස්තකාල පහසුකම් සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ පරිශිෂ්ටය III යටතට ගැනෙන ජාතික පාසල් නොවන, අවශ්‍ය පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා ළමුන්ට සහ වැඩිහිටියන්ට සහාය වීම ;

(ඇ) සාමාජිකයන්ගේ සහ සාමාජිකයන් නොවන තැනැත්තන්ගේ දක්ෂතා වර්ධනය කිරීම සඳහා කලා, සාහිත්‍ය කටයුතු, මූර්ති නිර්මාණ, රූපවාහිනී නාට්‍ය සහ වේදිකා නාට්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය ආධාර සැපයීම ;

(ඈ) ජනතාව අතර අන්‍යෝන්‍ය විශ්වාසය හා හොඳහිත වර්ධනය කිරීම සඳහා ජාතික හා ආගමික උත්සව හා ශ්‍රමදාන ව්‍යාපාර සංවිධානය කිරීම ;

(ඉ) පළපුරුද්ද සහ ශිල්පීය ඥානය හුවමාරු කර ගැනීමෙන් ජාතික සහ අන්තර් ජාතික සබඳතා වැඩි දියුණු කිරීම හා විනෝද ගමන් සංවිධානය කිරීම ;

(ඊ) තොරතුරු එක්රැස් කිරීමේ හා විමර්ශනය කිරීමේ කාර්යය සඳහා ආර්ථික සහ මානව සම්පත් එක්රැස් කිරීම ;

(උ) ආබාධිතයන්ට රැකවරණය සැළසීම සහ වැඩිහිටියන් සඳහා වැඩිහිටි නිවාස සැපයීම ;

(ඌ) පරිසරය සුරැකීම සහ කාබනික කෘෂිකර්මයේ නූතන ශිල්පීය ක්‍රම වර්ධනය කිරීම ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට අනුව තෝරා පත්කර ගනු ලබන සභාපතිවරයකු සහ නිල දරන්නන් හය දෙනකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ 8 වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීතිවලට යටත් ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බහුකාර්ය ආයතනයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, බහුකාර්ය ආයතනයේ නිර්මාතෘ සභාපතිවරයා වන පූජ්‍ය බානගල ගුණරත්න ස්වාමීන්වහන්සේ සංස්ථාවේ ප්‍රථම සභාපතිවරයා විය යුතු අතර, උන්වහන්සේ තවත් ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට ද සුදුස්සකු වන්නේ ය.

**5.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේම නම් ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට කළමනාකරණ කමිටුව විසින් කටයුතු සම්පාදනය කළ යුතු ය.

සාමාජික නාම ලේඛනය සහ සාමාජික ගාස්තු.

(2) (1) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නාම ලේඛනයට ස්වකීය නම ඇතුළත් කරනු ලැබ ඇති සෑම සාමාජිකයකු විසින් ම, තත් කාර්ය සඳහා සාදන ලද රීති යටතේ නියම කර ඇති යම් මුදල් ප්‍රමාණයක්, වාර්ෂික සාමාජික ගාස්තු වශයෙන් ගෙවිය යුතු ය.

**6.** පහත දැක්වෙන අවස්ථාවලින් යම් අවස්ථාවක් නිසා සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසන් විය යුතු ය :—

සාමාජිකත්වය අහෝසිවීම.

(i) සාමාජිකයා මිය යාම ;

(ii) ස්ථිර වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් බැහැරව විසීම ;

(iii) සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම ;

(iv) සංස්ථාවේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම වැළැක්වෙන අන්දමේ යම් ශාරීරික හෝ මානසික දුබලතාවයකට පත්වීම ;

(v) සාමාජිකයන්ගේ චර්යාව පිළිබඳව වූ විනය රීතිවලට පටහැනිව ක්‍රියා කිරීම ;

(vi) අනුක්‍රමිකව අවුරුදු දෙකක් සාමාජික ගාස්තු ගෙවීම පැහැර හැරීම.

සංස්ථාවේ බලතල.

7. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත සඳහන් කටයුතු එනම් :—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලයට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට ;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා රජයේ අනුමත බැංකු හා ආයතනවලින් (දේශීය හෝ විදේශීය) කළමනාකරණ කමිටුවේ අනුමතය ඇතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම ;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාරගැනීම, වට්ටම් කිරීම, ගනුදෙනු කිරීම, මිලයට ගැනීම, විකිණීම, නිකුත් කිරීම සහ බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කළමනාකරණ කමිටුව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම ;

(ඉ) සියලුම ආකාරයේ දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට ;

(ඊ) යම් තැනැත්තකු, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම ;

(ළ) යම් දේපළකට බලපාන යම් නීත්‍යානුකූල භාරයක් සහ කොන්දේසි භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ළු) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීම ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම,

සඳහා සංස්ථාවට බලය ඇත්තේය.

සංස්ථාවේ රීති.

8. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කරගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් විසින් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම, ධුර දරන්නන්ගේ ධුර කාලය සහ කළමනාකරණ කමිටුවේ නිලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) කළමනාකරණ කමිටුවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, පුරප්පාඩු පිරවීම, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම ;

(ඉ) කළමනාකරණ කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් එවැනි රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාවේ කළමනාකරණ කමිටුව විසින් අනුමත කරනු ලබන බැංකුවක හෝ බැංකුවල සංස්ථාවේ නමින් තැන්පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**10.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් ,

අදහස් වේ.

බහුකාර්ය ආයතනය විසින් සහ බහුකාර්ය ආයතනයට ගෙවිය යුතු ණය ආදිය සංස්ථාව විසින් සහ සංස්ථාවට ගෙවිය යුතු බව.

11. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බහුකාර්ය ආයතනයේ පැවති සියලු ණය සහ බැරකම් මේ යටතේ සංස්ථාපනය කළ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට බහුකාර්ය ආයතනයට ගෙවිය යුතු සියලු ණය, සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනත යටතේ සංස්ථාපිත සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන පිළිබඳව නිශ්චය කිරීම සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙර හෝ කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. සංස්ථාවේ සභාපතිවරයා හා ලේකම්වරයා සහ සංස්ථාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.